## අලව්ව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. පී. සී. රේණුකා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 122 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.06.05 දින තීරණ අංක 3326 යටතේ මම තීරණය කරමි. එනම් :

2025 වර්ෂය සඳහා පනවන ලද වාහන නතර කර තැබීමේ වලංගු අවසර පත්‍රයක් නිකුත් කිරීමේ ගාස්තුව, 2025 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. සී. රේණුකා,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2024 ජූලි මස 01 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු 126 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2010.07.16 වැනි දින අංක 1663 දරන *ගැසට් පත්‍රයේ,* වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව අලව්ව ප්‍රාදේශීය සභාව මගින් වැළඳගෙන ඒ බව 2011.07.22 අංක 1716 *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටසේ පළකරනු ලැබූ අතර, එම අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම සම්බන්ධයෙන් පහත උපලේඛනය පරිදි ගාස්තුවක් 2025 වර්ෂය සඳහා අයකළ යුතු බවත්, එකී ගාස්තුව ගෙවිය යුතු තැනැත්තෙකු විසින් 2025 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

| | | රු. ශත |
|---|---|---|
| 01. | වාහනය ලියාපදිංචි කිරීමේ ගාස්තුව | 100 0 |
| 02. | කාර්, වෑන් සහ ත්‍රී රෝද රථ සඳහා මාසික ගාස්තුව | 100 0 |
| 03. | බර වාහන සඳහා මාසික ගාස්තුව | 125 0 |
| 04. | ට්‍රැක්ටර්. අත් ට්‍රැක්ටර් සඳහා මාසික ගාස්තුව | 75 0 |

08 - 21/4

---

## අලව්ව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ඉඩම් විකිණීම විෂයෙහි බදු අයකිරීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. පී. සී. රේණුකා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 154 (3) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව ඉඩම් විකිණීම විෂයෙහි බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.06.05 දින තීරණ අංක 3327 යටතේ මම තීරණය කරමි. එනම් :

2025 වර්ෂය සඳහා පනවන ලද ඒ බදු සහ ගාස්තු, ඉඩම් වෙන්දේසි කරනු ලබන වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනු නියෝජිතයෙකු විසින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. සී. රේණුකා,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2024 ජූලි මස 01 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභාවේ පාලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනු නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක, එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක් (1%) සමාන බද්දක් හා අංක 1882/22 හා 2014.10.01 දිනැති ඉඩම් කට්ටි කිරීමේ සම්මත අතුරු ව්‍යවස්ථාවේ 15 වැනි වගන්තියේ සඳහන් සංවර්ධන සැළැස්ම හෝ අනු බෙදුම අනුමත කරවා ගැනීම සඳහා පරීක්ෂණ ගාස්තු වශයෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2025 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී බදු හා ගාස්තු කොන්ත්‍රාත් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම යෝජනා කරමි. (එසේ වුවද නාගරික සංවර්ධන අධිකාරි ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශවල ඉඩම් අනුබෙදුම් කිරීම, ඒකාබද්ධ කිරීම හා සංවර්ධනය කිරීමේ දී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් සාදන ලද අංක 2235/54-2021/07/08 අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* සඳහන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසිවල සඳහන් ගාස්තු අය කළ යුතුය.)

*උපලේඛනය*

| *ඉඩමේ ප්‍රමාණය* | *සංවර්ධන සැළැස්ම අනුමත කිරීම සඳහා ගාස්තුව රු. ශත* | *අනුබෙදුම අනුමත කිරීම සඳහා ගාස්තුව රු. ශත* |
|---|---|---|
| හෙක්ටයාර් 01 ට අඩු | 500 0 | 500 0 |
| හෙක්ටයාර් 01 ට වැඩි 02 දක්වා | 700 0 | 700 0 |
| හෙක්ටයාර් 02 ට වැඩි 04 දක්වා | 1,000 0 | 1,000 0 |
| හෙක්ටයාර් 04 ට වැඩි | 1,250 0 | 1,250 0 |

08 - 21/5

---

### අලව්ව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථානුකූල ගාස්තු අයකිරීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. පී. සී. රේණුකා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 122 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව 126 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව 2025 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථානුකූල ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.06.05 දින තීරණ අංක 3328 යටතේ මම තීරණය කරමි. එනම් ඃ

2025 වර්ෂය සඳහා පනවන ලද එම ගාස්තුව, දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට යටත් පිරිසෙයින් දවස් හතකට කලින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. සී. රේණුකා,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2024 ජූලි මස 01 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(අ) වගන්තිය සමග කියවිය යුතු 122 හා 126 වන වගන්තිවලින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව, 1988.08.23 වැනි දින අංක 520/7 දරන අති විශෙෂ *ගැසට් පත්‍රය* මගින්, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව, අලව්ව ප්‍රාදේශීය සභාව මගින් වැළඳගෙන ඒ බව 1998.08.28 වැනි දින අංක 1043 *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළකරනු ලැබූ අතර, එම අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි අතුරු ව්‍යවස්ථාව වන ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන අනුව, අලව්ව ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට,